**ISBN 978- 955-4563- 71- 1**

# ඩබ්.ඩබ්. රොස්ටොව්ගේ ආර්ථික වර්ධනයේ අවධි පිළිබඳ මාදිලියේ වලංගුතාව.

**එච්.ඒ.ටී. හෙට්ටිආරච්චි**
**ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය**

**සංක්ෂේපය**

**ආර්ථික සංවර්ධනය යනු ආර්ථික වෘද්ධියත් සමග සමගාමීව ගමන් කරන ක්‍රියාවලියකි. ආර්ථික වෘද්ධියත් සමග ඇතිවන ගුණාත්මක තත්ත්වයන්ගේ වර්ධනයක් ආර්ථික සංවර්ධනය තුළින් අපේක්ෂා කෙරේ. ආර්ථික වර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාඥයින් විවිධ න්‍යායන් හඳුන්වා ඇත. එයින් රොස්ටොව් න්‍යායට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. මෙම ලිපිය මගින් අවධානය යොමු කරන්නේ රොස්ටොව්ගේ අවධි පිළිබඳ න්‍යාය කොතරම් දුරට ශ්‍රී ලංකාවට අදාළ වේද යන්න පිළිබඳවයි. මෙය විශ්ලේෂණය කිරීම සඳහා රොස්ටොව් න්‍යාය පිළිබඳ ලියවී ඇති පොත් පත්, අන්තර් ජාල වාර්තා යොදා ගෙන ඇත. මෙමගින් එළඹි නිගමනය වන්නේ ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට මෙම න්‍යාය එලෙසින්ම අදාළ කරගත නොහැක. මන්ද එය ධනවාදී ආර්ථික ක්‍රමය පදනම් කරගෙන ගොඩනංවා ඇති න්‍යායක් නිසාය. ශ්‍රී ලංකා වැනි රටක් තුළ රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් දෙකම දක්නට ලැබේ. නමුදු රොස්ටොව් න්‍යාය තුළ රාජ්‍ය මැදිහත් වීමක් කෙලෙසින්වත් දක්වා නොමැති අතර නව ලිබරල්වාදී ප්‍රතිපත්තියක් මේ තුළින් උද්දීපනය කොට ඇති බව පැහැදිලිවනු ඇත.**
**මුඛ්‍ය පද- රොස්ටොව් න්‍යාය, ආර්ථික වර්ධන අවධි, ආර්ථික වෘද්ධිය, ආර්ථික සංවර්ධනය, ධනවාදී ආර්ථික ක්‍රමය**

## හැඳින්වීම

ආර්ථික සංවර්ධනය වනාහි කිසියම් වූ අදියරයන් දාමයක් තුළින් ක්‍රියාත්මකවන ක්‍රියාවලියක් වේ. ආර්ථික වර්ධනය පිළිබඳ ආර්ථික විද්‍යාඥයින් විසින් විවිධ න්‍යායන් හඳුන්වා දී ඇත. එසේ ඉදිරිපත් කළ සමහර න්‍යායන් දියුණු වූ ආර්ථිකයන් පදනම් කරගෙන ඉදිරිපත් වූ ඒවා වේ. හැරඩ්-ඩූමා වෘද්ධි මාදිලිය (Harrod-Domar Growth Modal) එවැන්නකි. එසේම ආර්ථික වර්ධනය පිළිබඳ වෘද්ධි න්‍යාය (Classical Theory of Economic Growth) සාර්ව ආර්ථික විද්‍යාත්මක අධ්‍යයනයන් තුළ ප්‍රාරම්භකයන් ලෙස ඉදිරිපත් කළ මෙම න්‍යාය ද සංවර්ධනය වන රටවල් සම්බන්ධයෙන් ප්‍රායෝගික වැදගත්කම අඩු වුවත්, සංවර්ධිත රටවල ආර්ථික සංවර්ධනය විග්‍රහ කිරීමෙහි ලා බොහෝ දුරට වැදගත් වේ. ඒ ආකාරයටම ගොඩනැගුනු න්‍යායක් ලෙස රොස්ටොව් න්‍යාය හඳුන්වා දිය හැකිය. ඇමරිකානු ජාතික ආර්ථික විද්‍යාඥයෙකු වූ W.W Rostow විසින් මෙම න්‍යාය වර්ෂ 1950 දී ඉදිරිපත් කෙරුණි. මෙය ආර්ථික වෘද්ධීන් පිළිබඳ අවධි න්‍යායක් වශයෙන් හඳුන්වනු ලබයි. දියුණු රටවල් ඓතිහාසිකව ලැබූ සංවර්ධන අත්දැකීම් මෙම න්‍යාය සඳහා පදනම් වී ඇත. එනම් දියුණු රටවල් සංවර්ධිත තත්ත්වයට ළඟා වීමට පසුකරන ලද කාලසීමාවන් අවධි (Stage of Ecocnomic Growth) වශයෙන් ගෙන මෙය ඉදිරිපත් කර ඇත. විශේෂයෙන්ම මෙහිදී යැපුම් කෘෂිකාර්මික සමාජවල සිට නූතන සංවර්ධන ආර්ථිකයක් කරා පරිවර්ථනය වූ  ආකාරයත්, එහි වලංගුතාවය පිළිබඳවත් මෙමගින් විමසීමකට ලක් කෙරේ.

## රොස්ටොව්ගේ ආර්ථික වෘද්ධි අදියර

අදියරයන් පිළිබඳ න්‍යායන් රොස්ටොව්ට පෙර ලොව ජනිත වී තිබූ බව ඉතිහාසයෙන් වාර්තා වේ. මේ අතර විශේෂයෙන් වැදගත්කමක් හිමි වන්නේ කාල් මාක්ස්ටය. කාල් මාක්ස්ගේ වැඩවසම් යුගය ධනවාදය කරා ද ඉන්පසුව සමාජවාදය කරා ද පිය නගා අවසානයේ සංවර්ධනයේ හිනිපෙත්තටම ප්‍රවේශවන ආකාරය න්‍යායගත කර පෙන්වීය. මේ තත්ත්වය පෙරදැරිකරගෙන කාල් මාක්ස්ගේ න්‍යාය ලොව ඉතිහාසගත විය. කාල් මාක්ස්ගේ පෙන්වාදීම වූයේ ධනවාදය ගරා වැටී අවසානයේ කොමියුනිස්ට් වාදය බිහිවන ආකාරයයි. රොස්ටොව් මෙයට ව්‍යතිරේඛීව ස්වකීය අදහස් ඔහුගේ න්‍යායෙන් ලොවට ගෙනහැර පෑවේය (උභයචන්ද්‍ර, 2009).
ඉහතින් දැක්වූ ආකාරයට අනුව රොස්ටොව් න්‍යාය අදියරයන් පහක් ඔස්සේ ක්‍රියාත්මක වී ඉදිරියට පැවතගෙන එන්නකි. මෙම න්‍යාය තුළින් කෘෂිකාර්මික සමාජයක සිට එනම් ඉතාම පහත් අවස්ථාවක සිට ක්‍රමයෙන් කාර්මික වශයෙන් දියුණු වූ ඉහළ පාරිභෝජන මට්ටමක් ඇති ආර්ථිකයක් දක්වා පරිවර්තනය වීම ඉදිරිපත් කොට ඇත. එම අදියරයන් පහත පරිදි දැක්විය හැකිය. සාම්ප්‍රදායික සමාජය (The Traditioíl Society). සීඝ්‍ර නැගීමට (පිම්ම පැනීමට) පූර්ව කොන්දේසි අවස්ථාව (The Pre-Condition for take-off in to self-sustaining Growth ). සීඝ්‍ර නැගීමේ අදියර (පිම්ම

**ISBN 978- 955-4563- 71- 1**

ආරෝහණය) (The Stage of Take-off ). සංවර්ධනයේ පරිණත අවස්ථාව (The Drive to Maturity). අධි පාරිභෝජන අවධිය (The Stage for High Mass Consumption) වශයෙනි.

**සාම්ප්‍රදායික සමාජය**

ආර්ථිකයක ගතානුගතික වූ වැඩිවශයෙන්ම සමාජීය හා සංස්කෘතික පරිසරය තුළ ඇළී ගැලී සිටින එකතැන ලැගුම්ගත් ස්වභාවයක් පවතින මෙම සමාජය තුළ සීමිත නිෂ්පාදන ශ්‍රිතයක් ක්‍රියාත්මක වේ. විශේෂයෙන්ම 19 වන ශතවර්ෂයේ කාර්මික විප්ලවයට පෙර තත්ත්වය තුළ මේ ස්වභාවය දක්නට ලැබුනි. ජනගහනයෙන් බහුතරයක් ජීවනෝපාය වශයෙන් කෘෂිකර්මය (75% ක් පමණ ) සිදු කල අතර විශේෂයෙන්ම සත්ව පාලනය , මල් වගාව මේ අතර ප්‍රධාන තැනක් ගත්හ. නොදියුණු ශිල්ප ක්‍රම භාවිතා කරමින් තම ජීවනෝපාය සිදුකරගත් මෙම සමාජ වැසියන් සරල ජීවන රටාවක් ගෙන යන ලදී. එමෙන්ම මෙම සමාජයේ ජනතාවට ලෝකය පිළිබඳ පවතින දැනුම ඉතා සීමිත වේ. භෞතික ලෝකය තුළ පවතින්නා වූ න්‍යායන් පිළිබඳව කිසිඳු අවබෝධයක් ඔවුක් තුළ නැත. එමෙන්ම එම න්‍යායන් කෙලෙස යොදා ගැනෙන්නේ ද යන්න ද ඔවුනට ගැටලුවකි. ජනගහනය ඉතා විශාල වන අතර එනම් දළ උපත් හා දළ මරණ අනුපාත ඉතා ඉහළ අගයක් පෙන්නුම් කරයි (උභයචන්ද්‍ර, 2009).
වගා කටයුතු සිදුකිරීමේදී ඉතා විශාල මට්ටමේ භූමි ප්‍රමාණ භාවිතා කරන අතර වෙළඳාම් ක්‍රමවේදය හා ප්‍රමාණයද ඉතා විශාල වේ. මෙම සමාජයෙහි මූලික ලක්ෂණයක් වන්නේ ජනගහනය හා ප්‍රමාණය වැඩිවීම අනුව කෘෂිකාර්මික ඵලදාව වැඩිවීමයි. එමෙන්ම මෙම සමාජය තුළ පවුල් ඒකකයට හිමි වන්නේ වැදගත් ස්ථානයකි. එසේම ඒක පුද්ගල නිෂ්පාදනය පහළ අගයක් ගනී. මෙසේ සිදුවීමට හේතුව වන්නේ නූතන විද්‍යා හා තාක්ෂණ දැනුම මෙම සමාජ ක්‍රමය තුළ නොතිබීමත් පවත්නා දැනුම ක්‍රමානුකූලව උපයෝගීකර නොගැනීමත්‍ය. මෙවන් සමාජ ස්ථරයක් දුර අතීතයේ සිටම පවතින්නක් බව එකී ස්ථරයේ ඉමක් කොනක් නොමැති බවත් රොස්ටොව් පෙන්වා දුන්හ.
වෙළඳාම නිරන්තර උච්ඡාවචනය වීම මෙම සමාජ ක්‍රමයේ පවතින දුර්වලතාවයක් වේ. මෙසේ උච්ඡාවචන සිදුවන්නේ දේශපාලන හා විෂමතාවන්ගේ බලපෑම මත වේ. විවිධ ආකාරයේ නිපැයුම් විවිධ ප්‍රමාණයන් ලෙස වැඩිවීමක් සිදුවුවත් අධික ජනගහනයක් ඇති නිසාවෙන් එය යැපීමට ප්‍රමාණවත් නොවනු ඇත. කෘෂිකර්මය මූලිකම ජීවනෝපාය වන බැවින් සම්පත්වලින් වැඩි කොටසක් ඒ සඳහා යොදා ගැනෙන අතර කෘෂිකාර්මික සමාජයක් වන නිසාවෙන් එම සමාජයට නිරන්තරයෙන් ගැටලුකාරී තත්වන්ට මුහුණ පෑමට සිදු වේ. එම නිසා මොවුන් පවතින සමාජයෙන් ඉහලට යාම සිදු වන්නේ ඉතාමත් සීමිත වශයෙනි. මෙම සමස්ථ ලක්ෂණ සාම්ප්‍රදායික සමාජය තුළ දක්නට ඇත.

**වර්ධනයේ පූර්ව අවශ්‍යතා බිහිවන අවධිය (Pre-Condition for Take-Off in to self-sustaining Growth)**

ඉහතින් දැක්වූසාම්ප්‍රදායික සමාජයෙන් අලුත් සමාජයකට ගමන් කිරීම මේ තුළින් සිදුවේ. මේ අවධිය තුළ ස්වයං සංවර්ධනයකට පූර්ව අවශ්‍යතා බිහිවීම සිදුවේ. පෙර තත්ත්වය තුළ එනම් සාම්ප්‍රදායික සමාජය තුළ භාවිත නොකළ නවීන තාක්ෂණය උකහා ගැනීමක් සිදුවේ. මෙහි මුල්ම අවධිය 17 වන ශතවර්ෂයේ අවසානයේත් 18 ශතවර්ෂයේ මුල්කාලය තුළ බටහිර යුරෝපය විසින් සම්පූර්ණ කළහ. 15 හා 16 වන සියවස් තුළදී බ්‍රිතාන්‍යයේ සීඝ්‍ර නැගීමට පූර්ව අවශ්‍යතා බිහිවන අවධිය ඉතා සෙමෙන් වර්ධනය වූහ. එකළ ඇතිවුන සමාජීය වෙනස්කම් නිසාවෙන් සංවර්ධනයට හිතකාමී/ආශා කරන පුද්ගල කණ්ඩායම් බිහිවිය. මේ හේතුව නිසාවෙන් සමාජයේ පුද්ගලයින්ගේ ආකල්ප, වටිනාකම් හා බලාපොරොත්තුවල වෙනස්වීම් ඇතිවිය. විශේෂයෙන්ම පවතින දැනුම හා තාක්ෂණය අනුව නව කර්මාන්තයන් ආරම්භ කිරීම සිදුවිය. මේ තුළින් පවතින වෙළඳපොළ පුළුල්වීමක් සිදුවිය. ආර්ථික තාක්ෂණික ආකල්පවල වෙනස්කම් පමණක් නොව දේශපාලන හා සමාජීය ක්ෂේත්‍රවලද විශාල වෙනස්කම් හට ගැනුනි. මේ තත්ත්වය මුලින්ම ළඟාකරගනු ලැබුවේ මහා බ්‍රිතාන්‍ය විසිනි. විශේෂයෙන්ම මෙම තත්ත්වයට ළඟාවීමේදී පහත දෑ සිදුවේ.
කාර්මීකරණය ඇතිවීමේදී මුලින්ම කාර්මික නොවන අංශවල විශාල පරිවර්තනයක් සිදුවේ. එනම් සමාජ පොදුකාර්ය අංශයේ (ගමනාගමන, විදුලිබල සේවා, සන්නිවේදන ක්‍රම ) ආදියේ වර් ධනයක් සිදුවේ. වැඩිවන ජනගහනයට ප්‍රමාණවත් අයුරින් කෘෂිකාර්මික නිෂ්පාදන වැඩිවේ. ආනයන වර්ධනය වේ. නිෂ්පාදන කටයුතුවලට අවැසි ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය වැඩිවේ. ඉතිරිකිරීම් වර්ධනය වන අතර ව්‍යවසායික කටයුතු පුළුල් වේ (පතිරගේ,2011).
සමාජය තුළ පුද්ගලයාගේ ආකල්ප, විප්ලවයන් තුළින් හටගනු ලබන සමාජීය වෙනස්කම් තුළින් ආර්ථික සංවර්ධනය මේ අවධිය තුළ සිදුවේ. එකතැන පල්වෙන ආර්ථිකයෙන් මිදී නවීන තාක්ෂණය ඔස්සේ නව සමාජයක් කරා පිය නැගිය යුතුය යන ආකල්ප ඇතිවීම තුළින් පූර්ව අවශ්‍යතා බිහිවන

**ISBN 978- 955-4563- 71- 1**

අවධිය ඇතිවිය යුතු සේම එසේ නොමැති නම් සංවර්ධනය සඳහා පහත කොන්දේසි අත්‍යවශ්‍යයෙන්ම තිබිය යුතුය. දේශාභිමානය නැතිනම් පෞද්ගලික අභිමාර්ථය නැතිනම් මුළු මහත් ජාතියේ හිත සුව පිණිස නොඑසේනම් අනාගත පරපුරෙහි සුභසෙත උදෙසා ආර්ථික සංවර්ධනය කළ යුතුය යන හැඟීම ජන සංහතිය තුළ ඇතිවිය යුතුය. රාජ්‍ය අංශය සේම පෞද්ගලික අංශය ද නව්‍යතාවයන් බිහි කරමින් කාර්යක්ෂමව කටයුතු උපරිම කිරීමක් කළ යුතුය.
රොස්ටොව්ට අනුව රටක් පෞරාණික සමාජීය විප්ලවයක් තුළින් නව සමාජ ක්‍රමයකට එළඹීමත් ආර්ථික සංවර්ධනයේ තීරණාත්මක සාධකය වන්නේ දේශපාලන විප්ලවයයි. රටක ආර්ථික සංවර්ධනය සඳහා ශක්තිමත් ආණ්ඩුක්‍රමයක් තිබියයුතු බව ඔහු දක්වයි. සියලු සංරෝධකයන් මැඩලමින් ආර්ථක සංවර්ධනය අනිවාර්යයෙන් ලොව රටවල් හිමිකරගත යුතු බව ඔහු පවසයි.

## සීඝ්‍ර නැගීමේ අවධිය හෙවත් පිම්ම ආරෝහණය (The Stage of Take-Off)

ඉහත අවධීන් තුළ සාම්ප්‍රදායික අවධියෙහි ආකල්ප වෙනස් කරමින් නව තාක්ෂණය උකහා ගනිමින් නව්‍යතාවලට උනන්දු වීමෙන් ආර්ථිකයක් සංවර්ධනය කරා ගමන් කිරීමට ප්‍රාරම්භයක් සපයයි. මෙම අවධිය තුළ සිදුවන්නේ සංවර්ධනයේ පූර්ව අවශ්‍යතා තව දුරටත් වර්ධනය වීමයි. එනම් මෙය එක්තරා සංක්‍රාන්තික අවධියකි. මෙම අවධිය තුළද විද්‍යාත්මක දැනුම උපයෝගීකරගැනීම විශේෂයෙන්ම සිදුවේ. එමෙන්ම සමාජීය පරිවර්තනයක් සමග එතෙක් අනෙකුත් අවධි තුළ පැවති බාධා, අවහිර ඉවත්කර ගනිමින් තිරසර සංවර්ධනයක් කරා ආර්ථිකය ගමන් කරනා ආකාරයක් දැකගත හැකිය. මෙය රොස්ටොව් උපමා කරන්නේ ගුවන් යානය පොළෝ තලයෙන් මිදී ඉහළට ගමන්කරන අවස්ථාවයි.
මෙම අවධිය තුළදී සැළකිය යුතු ඉහළ මට්ටමක ආයෝජන කටයුතු පවත්වාගෙන යන අතර තාක්ෂණික දියුණුව උපයෝගීකර ගනිමින් ආර්ථිකය අඛණ්ඩ වර්ධනයක අත්දැකීම් ලබා ගනී. රොස්ටොව් මෙම අවධිය නිර්වචනය කරන්නේ නිෂ්පාදන ශිල්පීය ක්‍රම ආදියෙහි විශාල වෙනසක් සිදුවන කාර්මික විප්ලවීය අවධිය වශයෙනි (පතිරගේ, 2011). මෙම සීඝ්‍ර නැගීම විවිධ රටවල විවිධ කාලපරිච්ඡේදයන් තුළ සිදුවී ඇත. ඒ අතර මහා බ්‍රිතාන්‍ය 1783-1802, ප්‍රංශය 1830-1860, බෙල්ජියම 1833-1860, ඇ.එ.ජ 1843-1860, ඉන්දියාව 1952, චීනය 1952, සිදුවිය.
රොස්ටොව් දක්වන ආකාරයට සීඝ්‍ර නැගීමේ අදියර දශක දෙකක් පමණවන බව දක්වයි. මේ සඳහා අවශ්‍ය කොන්දේසි කිහිපයක් පවතී.
ආයෝජන අනුපාතය ඉහළ මට්ටමක පවත්වා ගැනීම. එනම් මෙහිදී ඉහළ ආයෝජනයක් හා ඉතිරිකිරීම් ජාතික ආදායමෙන් 5% සිට 10% හෝ ඊට වැඩි ප්‍රමාණයක් විය යුතු බව දක්වයි. එසේම කාර්මික අංශයේ ඉහළ වර්ධනයක් මෙහිදී අපේක්ෂා කෙරේ. උදාහරණයක් වශයෙන් 1890 ට පෙර කැනඩාවෙහි හා 1917 ට පෙර ආජන්ටිනාවෙහි ප්‍රාග්ධන ආයෝජනවලින් වැඩි ප්‍රමාණයක් මෙම අදියරට අවශ්‍යවන කොන්දේසිය සපුරා ඇත. ආයෝජන අනුපාතයේ ඉහළ යාම නිසා ආයෝජන රටාවේ වෙනස්වීම් අනුව ප්‍රාග්ධන නිමවුම් අනුපාතයේ අඩුවීමක් ඇතිවේ. ඒ වගේම මූලික අංශවල වර්ධනයක් සිදුවීම මෙම අදියර තුළදී දක්නට ලැබේ.
උදාහරණ වශයෙන්, මූලික කර්මාන්තවල යකඩ, ගල් අඟුරු, ප්‍රවාහන අංශයේ වර්ධනය, දුම්රිය මාර්ග, මහා මාර්ග, බැංකුවැනි ක්ෂේත්‍රවල වර්ධනය, ජනගහනය හා කාර්මික නිෂ්පාදනවල සිදුවන වර්ධනය, ආහාර නිවාස ඉදිකිරීම් යන අංශවල සීඝ්‍ර වර්ධනයක් මේ කාලසීමාව තුළ ඇතිවේ.
කාර්මික අංශවල වෙනස්කම් සිදුවූ අතර කාර්මික භාණ්ඩවල සඵල ඉල්ලුම වැඩිවන පරිදි ඉතිරිකිරීම් තව දුරටත් මෙම අවධිය තුළ වර්ධනය වීමක් සිදුවේ. එසේම මෙහි දක්නට ලැබෙන තවත් ලක්ෂණයක් නම්, දේශපාලන සමාජ හා ආයතනික ව්‍යූහයේ වෙනස්කම් සිදුවීමයි. කෙසේ වෙතත් රොස්ටොව් අදියරයන් තුළ නව කර්මාන්ත සීඝ්‍රයෙන් වර්ධනය වීම, එයින් ලැබෙන ලාභ වෙනත් කර්මාන්තවල කරන ආයෝජනය, ඒවා ක්‍රමානුකූලව පවත්වාගෙන යාමට අවශ්‍යවන සේවා හා අනෙකුත් නිෂ්පාදිත සඳහා ඉල්ලුම වැඩිවී නාගරික ප්‍රදේශ තව තවත් ප්‍රසාරණය විය. විවිධත්වයෙන් යුතු කර්මාන්තයන් ව්‍යාප්ත විය. මෙම සෑම කර්මාන්තයකින්ම අතිරේක ආදායමක් ජනිත විය. ඉතිරිකිරීම් වර්ධනය වේ. නව ව්‍යවසාකත්ව පන්තීන් බිහිවේ. පෞද්ගලික අංශ නිෂ්පාදන ඉහළ යයි. ස්වභාවික සම්පත් හා නූතන නිෂ්පාදන ක්‍රම උපයෝගීකරගනිමින් නිෂ්පාදන සිදුකරයි. කෙසේ නමුදු මෙම අවධිය විවේචනයන්ට මූලිකම වශයෙන් බඳුන් වූ අවධිය ලෙස දැක්විය හැකිය.

## සංවර්ධනයේ පරිණත අවධිය (The Drive to Maturity)

ඉහත අවධීන් තුළ සාම්ප්‍රදායික අංශයක සිට කාර්මික අංශයට ක්‍රමයෙන් සංක්‍රමණය වූ ආකාරය රොස්ටොව් විග්‍රහ කරයි. මේ අවධිය තුළ සිදුවන්නේ සංවර්ධනය පරිණත අවස්ථාව කරා ගමන් කිරීමයි. මෙම අවධියට ප්‍රවේශවීමට එතරම් අපහසු නැත. තුන්වන අවධිය පසුකිරීමත් සමග මෙය ස්වයංක්‍රීයව සිදුවේ. මෙහිදී තිරසර ආර්ථික වර්ධන පසුබිමක් ඇතිවේ. ඒ අනුව මීට ප්‍රථමව

ISBN 978- 955-4563- 71- 1

ආනයනයන් මත රැඳී සිටියේනම් එම තත්ත්වය පහව යනු ඇත. එය පහත පරිදි වෙන් වෙන් වශයෙන් දැක්විය හැක.නව කර්මාන්ත ඉදිවේ. විශේෂයෙන්ම එම කර්මාන්ත ආනයන ආදේශන සහ අපනයන ප්‍රවර්ධන කරනු ලබන කර්මාන්ත වේ. නවීන තාක්ෂණයේ උසස් ප්‍රතිඵල කාර්යක්ෂමව උකහා ගැනීමත් නව නිෂ්පාදන ශිල්පක්‍රමයන් නිෂ්පාදන කටයුතු සඳහා යොදා ගැනීමත් මේ අවධිය තුළ සිදුවේ. මේ හේතුව නිසාවෙන් නිෂ්පාදන ධාරිතාව පුළුල් වේ. සීඝ්‍ර නැගීමේ අදියර තුළදී 5% ත් 10% ආසන්නව පැවති ආයෝජන අනුපාතය දළ ජාතික නිෂ්පාදිතයෙන් 10%සිට 20% දක්වා වර්ධනය වේ. ජනගහනය වර්ධන අනුපාතයට වඩා වැඩි වේගයකින් දළ ජාතික නිෂ්පාදිතය ඉහළ යන නිසා ඒක පුද්ගල මූර්ත ආදායම ඉහළයාම ආරම්භ වීම, සමස්ථ ආර්ථිකයට ජාත්‍යයන්තර ආර්ථිකයෙහි කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම, පවතින ආර්ථික ක්‍රමයට අවශ්‍යවන පරිදි සමාජ ස්ථරය ද ඊට අනුවර්තනය වීමක් සිදුවේ.

මෙම අදියර වන විට ශ්‍රම හමුදාවේ සිදුවන වෙනස්වීම් ඉතා වැදගත් බව රොස්ටොව් පෙන්වා දෙයි. ආර්ථිකයේ පුහුණු ශ්‍රම හමුදාව ඉහළ යයි. නාගරික ජනගහනයේ වර්ධනයක් සිදුවේ. ශ්‍රම හමුදාවේ මූර්ත වැටුප් වැඩිවේ. ව්‍යවසායකත්වයේ වෙනස්වීම් සිදුවන අතර වඩා කාර්යක්ෂම පරිපාලන ව්‍යූහයක් ඇතිවේ. මුළු සමාජ ව්‍යූහයම කාර්මීකරණයට ගැලපෙන අන්දමට හැඩගැසෙන ආකාරය දක්නට ලැබේ (පතිරගේ, 2011). කිසියම් රටක් මෙම අදියරට පැමිණෙන්නේ දශක 4 ත් 6 ත් අතර කාල පරිච්ඡේදයක් පසු කරමින් බව රොස්ටොව් පවසයි. විශේෂයෙන්ම ඉතා කුඩා කර්මාන්තවලින් ආරම්භ කරමින් තාක්ෂණික දැනුම පෘථුලව ව්‍යාප්ත කරමින් ශ්‍රම වහජනය, විශේෂීකරණය තුළින් රටක් නිෂ්පාදනය නොකළ යුතු දෑ හැර අනෙක් සෑම දෙයක්ම නිෂ්පාදනය කරනු ලබන තත්ත්වයට සමාජයම පුදුම කරවන අන්දමට පරිවර්ථනයක් ළඟාකර ගැනේ. සාමාන්‍යයෙන් පරිණතභාවයට අවශ්‍යවන මූලික කර්මාන්තවලින් එපිටට කර්මාන්ත දියුණුකර නව තාක්ෂණික විද්‍යා දැනුම උපයෝගීකරගෙන ඉතාම කාර්යක්ෂම ආකාරයට සිදුකිරීමට හැකියාව අත්කරදෙන තත්ත්වයක් මේ තුළදී සිදුවේ. මෙය ආර්ථිකයක් ක්‍රමිකව තවත් ආර්ථිකයකට සංක්‍රමණය වීමකි. ඒ යටතේ සෑම දෙයක්ම නිපදවීමට හැකි ශිල්පීය හා ව්‍යවසායික ඥානයක් හා තාක්ෂණික කටයුතු පිළිබඳ ඥානයත් යන දෙකම අත්පත්කර ගනී.

## ඉහළ පරිභෝජන අවධිය (The Stage of Mass Consumption)

මෙම අදියරට ළඟාවූ ආර්ථිකයක ජනතාව තුළ ඉහළ ජනතාව තුළ ඉහළ ජීවන මට්ටමක් හා පරිභෝජනයේ ඉහළයාමක් සිදුවේ. එනම් මෙම අවධිය තුළ ඒකපුද්ගල මූර්ත ආදායම ඉහළ යයි. මිනිසාගේ මූලික අවශ්‍යතාවලින් ඔබ්බට පරිභෝජනය ගමන් කරනු ඇත. එබැවින් සුඛෝපභෝගී භාණ්ඩ පරිභෝජනය කරමින් ඉතා සැපවත් ජීවිතයක් ගත කිරීමට ජනතාව පෙළඹේ. එනම් සමෘද්ධිමත් ජනතාවක් සහිත ආර්ථිකයක ලක්ෂණ මෙම අදියර තුළ දක්නට ලැබේ. ජනතාවගේ ජීවන තත්ත්වයේ උසස් වීමක් සිදුවේ. එසේම ආර්ථිකයේ ප්‍රධාන නිෂ්පාදන අංශ ලෙස ඉස්මතු වී තිබෙන්නේ කල් පවත්නා හා නවීන වැඩිදියුණු වීම් සහිත වූ පරිභොජන භාණ්ඩ හා සේවා නිෂ්පාදන කටයුතු වේ.

ඓතිහාසිකව සලකා බැලූ විට ඇමරිකා එක්සත් ජනපදය 1920 දී ප්‍රථමයෙන් ඉහළ පරිභෝජන මට්ටමට ළඟා වූ අතර බ්‍රිතාන්‍ය 1930 ගණන්වලදී ද ජපානය 1950 න් පසුව ද ඉහළ පරිභෝජන අවධියට ළඟාවිය. මේ ආකාරයට ආර්ථික වෘද්ධිය පිළිබඳ අවධි න්‍යාය 1950, 1960 දශකයන් තුළ ආර්ථික වර්ධනය පිළිබඳ ඉතා වැදගත් ආකෘතියක් ලෙස ප්‍රසිද්ධියට පත් විය. මේ ආකාරයට සාම්ප්‍රදායික කෘෂි ආර්ථිකයක සිට නවීන කාර්මික ආර්ථික ක්‍රමයක් දක්වා කිසියම් රටක් යන්නා වූ මෙම ගමන පෙර සඳහන්කළ පරිදිම ගුවන් යානාවක් පොළවේ සිට අහසට ඉගිලී යන අවධියට සමානකර දක්වා තිබේ. ඒ අනුව ගුවන් යානාවක් එකතැන නිසොල්මනේ සිටීම සාම්ප්‍රදායික සමාජ අදියර ලෙස දක්වා ඇත. එම ගුවන්යානය තෙල් ඉන්ධන ආදිය යොදා ඉංජිනේරුවන් විසින් එන්ජිම පරීක්ෂාකර බලා ගවන්ගමනට සූදානම් කරමින් නොනවතින වර්ධනයක් කරා ආර්ථිකය ඉගිලීමට අවශ්‍ය පූර්ව කොන්දේසිය බිහිකරනු ලබන අවධිය වේ. එමෙන්ම අහස්යානය පෘථිවි ආකර්ශනයෙන් මිදී අහසට නැගීම සීඝ්‍ර නැගීමේ අදියර වේ. එමෙන්ම ඉහළ අහස්තලය තුළ ගුවන්යානයෙහි ගමන මෙහෙයවීම පරිණතබව කරා ආර්ථිකය ගමන්කරවන අදියර වේ. ඉහළ අහසේ ගුවන්යානය නොකඩවා යන දිගු ගමන ආර්ථිකයේ ඉහළ පරිභෝජන අදියර ලෙස හඳුන්වා දී ඇත.

රොස්ටොව් න්‍යාය ආර්ථික වර්ධනය පිළිබඳව ඉදිරිපත් වූ න්‍යායන් අතර ඉතා විශිෂ්ඨ න්‍යායක් වුවත් ඒ සඳහා ද යම් යම් විවේචන පවතී. එනම් රොස්ටොව් න්‍යාය කෙතරම් දුරට වලංගුවේ ද යන්න පරීක්ෂා කළ යුතුය.

**ISBN 978- 955-4563- 71- 1**

## රොස්ටොව් න්‍යායේ වලංගුතාව

සංවර්ධනය පිළබඳ අවධි විග්‍රහය ඉතා හොඳින් රොස්ටොව් ඉදිරිපත් කළ ද එහි වලංගුතාව කොතරම් දුරකට පවතිනවා ද යන්න විග්‍රහයට බඳුන් කළ යුතුය. විශේෂයෙන්ම රොස්ටොව් දක්වන ආකාරයට, සංවර්ධනයට පත්වන රටක් යැපුම් කෘෂිකාර්මික සමාජවල සිට නූතන කාර්මික සංවර්ධන අදියරක් කරා ගමන් කරනු ලබයි. එහිදී, ඔහු දක්වන්නේ සංවර්ධනය වන රටක් මෙම වර්ධන අදියර පහ අනිවාර්යයෙන්ම පසු කරන බවයි. මෙම ඉදිරිපත් කිරීම ඔහුගේ න්‍යායේ වලංගුතාව බිඳවැටීමට තුඩුදෙන කාරණයකි. මන්ද යත් රටක් සංවර්ධනය කරා යන ගමනට සාම්ප්‍රදායික සමාජයක් පැවතීම අත්‍යවශ්‍ය කාරණයක් නොවේ. උදාහරණයක් වශයෙන් ඇමරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ නවසීලන්තය වැනි රටවල් සංවර්ධනය කරා යන ගමනේදී මෙම සාම්ප්‍රදායික සමාජය පැවතුනේ නැත. අනෙක් අතට ඔහු විග්‍රහ කරන දෙවනි අදියර එනම් සීඝ්‍රනැගීමට පූර්ව අවශ්‍යතා බිහිවන අවධිය මෙම න්‍යාය තුළ අත්‍යවශ්‍ය අංගයක් නොවන බව ප්‍රකාශ කළ හැක. එමෙන්ම සමාජ පොදුකාර්ය අංශයන්ගේ එනම් ගමනා ගමන විදුලිබල සේවා සංනිවේදන දියුණුව ආදිය සීඝ්‍ර නැගීමේ අවධිය කරා පැමිණීමට අවශ්‍ය කොන්දේසියක් බව රොස්ටොව් දැක්වුව ද එය අවශ්‍යම කොන්දේසියක් නොවේ. මෙහි පවතින තවත් දුර්වලතාවක් වන්නේ, කෘෂිකාර්මික විප්ලවයකින් පසුව සීඝ්‍ර නැගීමේ අදියරට පැමිණෙන බවයි. නමුදු, නවසීලන්තය හා ඩෙන්මාර්කය වැනි රටවල් සීඝ්‍රනැගීමේ අදියරට පිවිසුනේ කෘෂිකාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙනි. ඒ අනුව රොස්ටොව්ගේ අවධි විග්‍රහය ප්‍රත්‍යක්ෂ නොවනු ඇත. අනෙක් අතට මේ එක් එක් අවධීන්වල වෙනස්කම් වෙන් වෙන් වශයෙන් හඳුනාගැනීමට අපහසු වනු ඇත. විශේෂයෙන්ම දෙවන හා තෙවන අවධීන් තුළ විද්‍යාමානවන ලක්ෂණ බෙහෙවින් සමාන වී තිබීම නිසා ඇතැම් විට ඒවා අතිච්ඡාදනය (Overlap) වීමක් දක්නට ලැබේ.

තවද මෙම වෘද්ධි මාදිලිය බටහිර යුරෝපීය රටවල් සමග සසඳා බලන විට එක්තරා ආකාරයකට ගැලපීමක් දක්නට ලැබෙන බව පැහැදිලිය. මෙම ආකෘතියේ ඉතිරි කිරීම් හා ආයෝජන ආර්ථික වර්ධනය සඳහා අවශ්‍ය මූතික කොන්දේසියක් ලෙස දක්වා ඇත. නමුත් එය ප්‍රමාණවත් කොන්දේසියක් ලෙස දක්වා නැත. එයද මෙහි වලංගුතාව බිඳවැටීමට තුඩුදෙන කාරණයකි. බටහිර රටවල් සම්බන්ධයෙන් සලකන විට එම රටවල්වල දක්නට ලැබෙන හොඳින් ඒකාබද්ධ වූ භාණ්ඩ හා මුදල් වෙළඳපොළ, ගමනා ගමන පහසුකම්වල වර්ධනය, පුහුණු මිනිස් බලයේ වර්ධනය ආයතනික හා ව්‍යූහමය වෙනස්වීම් වැනි කරුණු ඉහළ නිමවුමක් ළඟාකරගැනීම සඳහා බොහෝදුරට උපකාරී වී තිබේ.

නමුත් සංවර්ධනය වන රටවල්වල ආර්ථිකයන්හි දක්නට ලැබෙන පුහුණු ශ්‍රම හිඟය, ආර්ථික පරිපාලනය මෙන්ම දේශපාලන අස්ථාවරත්වය වැනි හේතු නිසා තවමත් මෙම රටවල ඉහළ පරිභෝජන අවස්ථාව කරා ගමන් කිරීමට නොහැකි වී ඇත. G.M.Meier (1976) ආර්ථික විද්‍යාඥයාට අනුව, සෑම රටක්ම මෙලෙසින් අවධි පහක් පසුකර නැත. ඔහු දක්වන ආකාරයට සීඝ්‍ර නැගීමේ ආර්ථික වර්ධනය ඉහළ ආයෝජනයක් ලබා ගැනීමට ප්‍රමාණවත් නොවේ. ආයෝජනයේ ආංශික ව්‍යාප්තිය, ප්‍රාග්ධන නිමවුම ආර්ථික සංවර්ධනය සඳහා අවශ්‍ය වේ.

මෙම වෘද්ධි මාදිලිය තුළ ඉතාම වැදගත් අදියරක් වන්නේ සීඝ්‍ර නැගීමේ අදියරයි. එම අදියර දියුණු රටවල කාර්මීකරණ අවධිය හා හොඳින් ගැලපෙන බව A.K.Dass Guptha විසින් දක්වා ඇත. සීඝ්‍ර නැගීමේ අවධියේ අපේක්ෂිත මූලික කොන්දේසිය ප්‍රාග්ධන සම්පාදනය ඉහළ යාම, ප්‍රාග්ධන නිමවුම් අනුපාතය පහළ වැටීම සහ ආර්ථිකයේ ප්‍රධාන අංශවල සිදුවන වර්ධනය රටක කාර්මීකරණය සඳහා වැදගත්වන බව ඔහු දක්වා තිබේ. නමුත් සංවර්ධනය වන රටවල ආයෝජන අනුපාතය එසේ වර්ධනය කර ගැනීම පිළිබඳ ගැටලු මතුවේ. මෙම රටවල ප්‍රාග්ධන සම්පාදනයේ ප්‍රධාන මූලාශ්‍රය වන දේශීය හා විදේශීය ඉතිරිකිරීම් සම්බන්ධ හිඟයක් දක්නට ලැබීම ඊට ප්‍රධාන හේතුව වේ (පතිරගේ, 2011).

මෙම වෘද්ධි මාදිලිය තුළින් අවසානයේ ලිබරල්වාදී ප්‍රතිපත්තියක් යොදවා ගැනීමට පොළඹවන තත්ත්වයක් ඇත. අඩු වැටුප් ලබන රටවල්වල කාර්මික පදනම සකස්කළ යුතුයැයි හැඟෙන කරුණු සමුදායක් මේ තුළ ඉදිරිපත් වී ඇති බව විවේචකයින් අදහස් දක්වා ඇත. එනම් මේ තුළ කිසිඳු ආකාරයකට රටක් පවත්වාගෙනයාම සඳහා රාජ්‍ය මැදිහත්වීමක් දක්නට නැති බවත් වෙළඳපොළ බලවේග මගින් ආර්ථිකය හැසිරවීමක් සිදුවන බවක් දක්වා ඇත. විශේෂයෙන්ම මේ තුළින් පෞද්ගලික ව්‍යවසාය ක්‍රමය ඇතිකිරීමට උත්සාහ ගෙන ඇත. මේ සඳහා උදාහරණයක් ලෙස 1970 ගණන්වල ඇමරිකා එක්සත් ජනපදය හා  එක්සත් ජනපදය වැනි රටවල් ගෙන ගිය පුද්ගලීකරණ ක්‍රියාවලිය දැක්විය හැකිය. මෙම න්‍යාය ඇමරිකාව සහ යුරෝපීය ඉතිහාසයේ සිදුවීම් පදනම් කරගෙන නිර්මාණය වීමත් අධි බහුජන පරිභෝජනය පිළිබඳ ඇමරිකානු මතවාදය පදනම් කර ගනිමින් සෑම දියුණු කාර්මික රටකම සංවර්ධනය දක්වා ඇත. නමුත් ආසියානු අප්‍රිකානු රටවල තත්ත්වයන්ට ගැලපෙන පරිදි රොස්ටොව් න්‍යාය යොදවා ගැනීම කෙතරම් සුදුසු ද යන්න ඒ ඒ රටවල තත්ත්වයන්ට සාපේක්ෂව දක්වා නොමැති වීම ද මෙහි දුර්වලතාවක් වේ. එසේම ශ්‍රී ලංකාව

**ISBN 978- 955-4563- 71- 1**

වැනි රටවල සාම්ප්‍රදායික ලක්ෂණ පවතින අතර එනම් වැඩවසම් ලක්ෂණ පවතින බැවින් ධනේෂ්වර සමාජ සම්බන්ධතා වර්ධනය වීමක් සිදු නොවීම. රොස්ටොව් දක්වන ආකාරයට අවධි පිළිබඳ න්‍යායේදී කෘෂි කාර්මික විප්ලව සහ කාර්මික විප්ලව දක්නට ලැබේ. නමුත් ශ්‍රී ලංකාව තුළ මෙම කිසිඳු විප්ලවයක් ඇතිවී නැත. එබැවින් මෙම න්‍යාය කෙසේවත් ශ්‍රී ලංකාවට අදාළ කර ගත නොහැක. ඕනෑම ආර්ථිකයක් තුළ ආර්ථික අවපාත තත්ත්වයන් ඇතිවිය හැකිය. නමුත් රොස්ටොව් අවධි විග්‍රහය තුළ ආර්ථිකයක ඇතිවිය හැකි ආර්ථික අවපාත තත්ත්වයන් පිළිබඳ කිසිඳු සඳහනක් කර නොමැත. ස්ථාවර ප්‍රාග්ධන නිමවුම් අනුපාතය මගින් රොස්ටොව් යෝජනා කරනුයේ ස්ථාවර පරිමාණානුකූල ඵල වේ. නමුත් මෙය අදාල වන්නේ සංවර්ධිත රටවල් සඳහාය. මෙය සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අදාළ කරගත නොහැක. මන්ද, මේ රටවල් නිරන්තරයෙන් ප්‍රාථමික නිෂ්පාදන, ප්‍රාථමික තාක්ෂණය යටතේ භාණ්ඩ නිෂ්පාදනය කරයි. වෙනස් නොවන තාක්ෂණය හා ජනගහන ප්‍රසාරණය නිසාවෙන් ස්වභාවික සම්පත් මගින් හීනවන ඵල පෙන්නුම් කරනු ලබයි. සංවර්ධනය වෙමින් පවතින රටවල්වල ආර්ථික ව්‍යූහයන් පදනම් කරගෙන ගොඩ නංවා ඇති නව මාක්ස්වාදී න්‍යායක් තුළ ධනේෂ්වර න්‍යායන් ප්‍රතික්ෂේප වී යනු ඇත.

## නිගමනය

රොස්ටොව්ගේ අවධි පිළිබඳ න්‍යාය ආර්ථික වර්ධනය පිළඹිබු කෙරෙන න්‍යායන් අතර වැදගත් න්‍යායක් වේ. රොස්ටොව් වසින් මෙය අවධි පහක් යටතේ විග්‍රහකර ඇත. මෙය රටක ආර්ථික සංවර්ධනය විග්‍රහ කිරීමෙහිලා ඉතා වැදගත් වේ. රොස්ටොව් න්‍යාය තුළින් වැඩි දුරටත් පැහැදිලි කරනු ලබන්නේ කෘෂිකාර්මික ආර්ථිකයක සිට ක්‍රමයෙන් කාර්මික ආර්ථිකයක් (නවීකරණය) කරා ආර්ථිකය ගමන් කිරීම පිළිබඳවයි. නමුත් ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට මෙම න්‍යාය එලෙසින්ම අදාළ කරගත නොහැක. මන්ද එය ධනවාදී ආර්ථික ක්‍රමය හිසෙහි රඳවාගෙන විග්‍රහකළ න්‍යායක් යැයි පැවසිය හැක. ශ්‍රී ලංකා වැනි රටක් තුළ රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් දෙකම දක්නට ලැබේ. නමුදු රොස්ටොව් න්‍යාය තුළ රාජ්‍ය මැදිහත් වීමක් කෙලෙසින්වත් දක්වා නොමැති අතර නව ලිබරල්වාදී ප්‍රතිපත්තියක් මේ තුළින් උද්දීපනය කොට ඇත. රොස්ටොව් විවිධ අවධීන් පසු කරමින් අධි පරිභෝජන අවධිය දක්වා ගමන් කිරීම ඉතා හොඳින් විග්‍රහ කර ඇතත් ඒ එක් එක් අවධියට ළඟාවන්නේ කෙසේද එනම් මාර්ග පැහැදිලි කිරීමක් සිදුකර නැත. ඔහු දක්වන්නේ එක් එක්  සමාජයේ ස්වභාවය නැතිනම් ගති ලක්ෂණ පැහැදිලි කිරීමක් පමණකි. මෙම අවධි න්‍යාය වඩා වැදගත් වන්නේ එම අවධීන් කරා ළඟා වූ මාර්ග විග්‍රහ කර ඇත්නම් පමණකි. නමුත් මේ තුළ ඒ පිළිබඳ කිසිඳු සඳහනක් නැත. තවද රොස්ටොව් විසින් සේවා වියුක්ති ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට අසමත් වී ඇත. එබැවින් මෙම න්‍යාය ආර්ථික වර්ධනයේ ස්වභාවය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි වුවත් සමස්ථයක් වශයෙන් සංවර්ධනය වෙමින් පවත්නා රටක ආර්ථික වර්ධනය විග්‍රහ කිරීමෙහිලා මෙම න්‍යාය යොදාගත නොහැකි බව පෙන්වා දිය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


අන්ද්‍රාදි  ටී, කොල්ලකාරී ධනවාදයට එරෙහිව මාක්ස් වාදය, කර්තෘ ප්‍රකාශන.

උභයචන්ද්‍ර ඊ. ජී, (2009), සංවර්ධන ආර්ථික විද්‍යාවඃ වෘද්ධි මාදිලි පිළිබඳ විශේෂ අවධාරණයකින් යුතුව, සරසවි ප්‍රින්ටර්ස්, කැලණිය.

පතිරගේ පොඩිමැණිකේ ජේ.එම්, (2011), සංවර්ධන ආර්ථික විද්‍යාව න්‍යායන් හා සංකල්ප, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10.

Goulet, D (1971). The Cruel Choice: A New Concept in the Theory of Development, NewYork: Athenium.

Meier, Gerald M. and James, E Rauch,(2006),8th Edition, Leading Issues in Economic Development, Oxford: Oxford University Press.

Myrdal,G. (1957), Economic Theory and underdeveloped Regions,London, Methun and Company.

Rostow,W.W (2008).The five Stages of Growth: In M.A.Seligson&P.S.J.T(Eds),Development and Under-development: The Political Economy ofglobal inequality:Colorado:Lynne Rienner Publishers.

Rostow,W.W (1956).The Stages of Economic Growth: A Non Communist Manifesto, Cambridge, England: Cambridge University Press.

Sen,A.K (1999). Development as Freedom, Oxford: Oxford University Press.

Taneja,M.L, and Sharma,L.R.(1986),Economics of Development and Planing,(with special reperance to India)Delhi,Shoban Lal NaginChand&CO

Parr,J.B (2001). On the Regional Dimensions of Rostow's Theory of Growth,University of Glasgow, Refered from http://www.geo.ntu.edu.tw/moise/data/Books/Economical/e 28/

Rostow,W.W (1960).The Stages of Economic Growth: A Non Communist Manifesto, Cambridge UniversityPress Refered from http://www.mthliyoke. Edu/acad/Intrel/Ipe/rostow.htm